vii. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ෂවින් ප්‍රනාන්දු මහතා **විසින් ඉදිරිපත් කර ඇති මැ/නයිනමඩම මයිකල් මහතාගේ නිවස අසල මාර්ගය පවරා ගැනීමට අදාල යෝජනාව** සහා අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාවට යෝජනා කරන ලදී.

- මාර්ගයේ නම -**මයිකල් මහතාගේ නිවස අසල මාර්ගය**
- ආරම්භක ස්ථානය- මනුර -නිව්ටන් මාවත
- අවසන් ස්ථානය- පෞද්ගලික නිවස
- මාර්ගයේ දිග- මීටර් 39.75
- මාර්ගයේ පළල- මීටර් 3

- ග්‍රාම සේවා වසම **-මැ/නයිනමඩම**

<table><tr><td>
තීරණ අංක 14

ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර ඇති මැ/නයිනමඩම මයිකල් මහතාගේ නිවස අසල මාර්ගය පවරා ගැනීමට අදාල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්. එම්. කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහ සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

<ul>
<li>මාර්ගයේ නම -මයිකල් මහතාගේ නිවස අසල මාර්ගය</li>
<li>ආරම්භක ස්ථානය- මනුර -නිව්ටන් මාවත</li>
<li>අවසන් ස්ථානය- පෞද්ගලික නිවස</li>
<li>මාර්ගයේ දිග- මීටර් 39.75</li>
<li>මාර්ගයේ පළල- මීටර් 3</li>
<li>ග්‍රාම සේවා වසම -මැ/නයිනමඩම</li>
</ul>
</td></tr></table>

viii. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා **විසින් ඉදිරිපත් කර ඇති නැ/නයිනමඩම ජගත් මහතාගේ නිවස අසල මාර්ගය පවරා ගැනීමට අදාල යෝජනාව** සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාවට යෝජනා කරන ලදී.

- මාර්ගයේ නම **-ජගත් මහතාගේ නිවස අසල මාර්ගය**
- ආරම්භක ස්ථානය- ප්‍රධාන මාර්ගය
- අවසන් ස්ථානය- නිවස
- මාර්ගයේ දිග- මීටර් 39.75
- මාර්ගයේ පළල- මීටර් 3
- ග්‍රාම සේවා වසම **-නැ/නයිනමඩම**

<table><tr><td>
තීරණ අංක 15

ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර ඇති නැ/නයිනමඩම ජගත් මහතාගේ නිවස අසල මාර්ගය පවරා ගැනීමට අදාල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්. එම්. කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහ සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

<ul>
<li>මාර්ගයේ නම -ජගත් මහතාගේ නිවස අසල මාර්ගය</li>
<li>ආරම්භක ස්ථානය- ප්‍රධාන මාර්ගය</li>
<li>අවසන් ස්ථානය- නිවස</li>
<li>මාර්ගයේ දිග- මීටර් 39.75</li>
<li>මාර්ගයේ පළල- මීටර් 3</li>
<li>ග්‍රාම සේවා වසම -නැ/නයිනමඩම</li>
</ul>
</td></tr></table>

ix. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා **විසින් ඉදිරිපත් කර ඇති නැ/නයිනමඩම කොස්තා මහතාගේ නිවස අසල මාර්ගය පවරා ගැනීමට අදාල යෝජනාව** සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාවට යෝජනා කරන ලදී.

- මාර්ගයේ නම **-කොස්තා මහතාගේ නිවස අසල මාර්ගය**
- ආරම්භක ස්ථානය- **කොස්තා මහතාගේ නිවස අසල මාර්ගය** (තෙරේසා මාවත)
- අවසන් ස්ථානය-පෞද්ගලික නිවස
- මාර්ගයේ දිග- මීටර් 95.25

- මාර්ගයේ පළල- මීටර් 2.7
- ග්‍රාම සේවා වසම -නැ/නයිනමඩම

| |
|---|
| තීරණ අංක 16<br><br>ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා **විසින් ඉදිරිපත් කර ඇති නැ/නයිනමඩම කොස්තා මහතාගේ නිවස අසල මාර්ගය පවරා ගැනීමට අදාල යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්. එම්. කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහ සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.<br><br>➢ මාර්ගයේ නම **-කොස්තා මහතාගේ නිවස අසල මාර්ගය**<br>➢ ආරම්භක ස්ථානය- **කොස්තා මහතාගේ නිවස අසල මාර්ගය (**තෙරේසා මාවත)<br>➢ අවසන් ස්ථානය-පෞද්ගලික නිවස<br>➢ මාර්ගයේ දිග- මීටර් 95.25<br>➢ මාර්ගයේ පළල- මීටර් 2.7<br>➢ ග්‍රාම සේවා වසම -නැ/නයිනමඩම |

x. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා **විසින් ඉදිරිපත් කර ඇති නැ/නයිනමඩම ජුබිලි මාවතේ තුන් වන පටුමඟ පවරා ගැනීමට අදාල යෝජනාව** සහා අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාවට යෝජනා කරන ලදී.

- මාර්ගයේ නම **-ජුබිලි මාවතේ තුන් වන පටුමඟ**
- ආරම්භක ස්ථානය- ප්‍රධාන මාර්ගයේ වම් අතුරු මාර්ගය
- අවසන් ස්ථානය- පෞද්ගලික නිවස
- මාර්ගයේ දිග- මීටර් 39.75
- මාර්ගයේ පළල- මීටර් 3
- ග්‍රාම සේවා වසම **-නැ/නයිනමඩම**

| |
|---|
| තීරණ අංක 17<br><br>ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා **විසින් ඉදිරිපත් කර ඇති නැ/නයිනමඩම ජුබිලි මාවතේ තුන් වන පටුමඟ පවරා ගැනීමට අදාල යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්. එම්. කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහ සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.<br><br>➢ මාර්ගයේ නම **-ජුබිලි මාවතේ තුන් වන පටුමඟ**<br>➢ ආරම්භක ස්ථානය- ප්‍රධාන මාර්ගයේ වම් අතුරු මාර්ගය<br>➢ අවසන් ස්ථානය- පෞද්ගලික නිවස<br>➢ මාර්ගයේ දිග- මීටර් 39.75<br>➢ මාර්ගයේ පළල- මීටර් 3<br>➢ ග්‍රාම සේවා වසම **-නැ/නයිනමඩම** |

xi. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා **විසින් ඉදිරිපත් කර ඇති නැ/නයිනමඩම මේරි මාවත පවරා ගැනීමට අදාල යෝජනාව** සහා අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාවට යෝජනා කරන ලදී.

- මාර්ගයේ නම **-මේරි මාවත**
- ආරම්භක ස්ථානය- සුසිල් මහතතාගේ නිවස අසල
- අවසන් ස්ථානය- පෞද්ගලික නිවස

- මාර්ගයේ දිග- මීටර් 65
- මාර්ගයේ පළල- මීටර් 2.7
- ග්‍රාම සේවා වසම **-නැ/නයිනමඩම**

තීරණ අංක 18

ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා **විසින් ඉදිරිපත් කර ඇති නැ/නයිනමඩම මේරි මාවත පවරා ගැනීමට අදාල යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්. එම්. කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහ සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

- මාර්ගයේ නම **-මේරි මාවත**
- ආරම්භක ස්ථානය- සුසිල් මහතතාගේ නිවස අසල
- අවසන් ස්ථානය- පෞද්ගලික නිවස
- මාර්ගයේ දිග- මීටර් 65
- මාර්ගයේ පළල- මීටර් 2.7
- ග්‍රාම සේවා වසම **-නැ/නයිනමඩම**

xii. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා **විසින් ඉදිරිපත් කර ඇති වෙල්ලමංකරය එකමුතු මාවත පවරා ගැනීමට අදාල යෝජනාව** සහා අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාවට යෝජනා කරන ලදී.

- මාර්ගයේ නම **-එකමුතු මාවත**
- ආරම්භක ස්ථානය- ඩෙස්මන් මහතතාගේ නිවස අසල
- අවසන් ස්ථානය- වෙරළ
- මාර්ගයේ දිග- මීටර් 95.25
- මාර්ගයේ පළල- මීටර් 2.7
- ග්‍රාම සේවා වසම **-වෙල්ලමංකරය**

තීරණ අංක 19

ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා **විසින් ඉදිරිපත් කර ඇති වෙල්ලමංකරය එකමුතු මාවත පවරා ගැනීමට අදාල යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්. එම්. කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහ සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

- මාර්ගයේ නම **-එකමුතු මාවත**
- ආරම්භක ස්ථානය- ඩෙස්මන් මහතතාගේ නිවස අසල
- අවසන් ස්ථානය- වෙරළ
- මාර්ගයේ දිග- මීටර් 95.25
- මාර්ගයේ පළල- මීටර් 2.7
- ග්‍රාම සේවා වසම **-වෙල්ලමංකරය**

xiii. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා **විසින් ඉදිරිපත් කර ඇති වෙල්ලමංකරය මහතුන් මහතාගේ නිවස අසල මාර්ගය පවරා ගැනීමට අදාල යෝජනාව** සහා අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාවට යෝජනා කරන ලදී.

- මාර්ගයේ නම **-මහතුන් මහතාගේ නිවස අසල මාර්ගය**
- ආරම්භක ස්ථානය- මූට්ටුව වේලන්කන්නි පල්ලිය අසල
- අවසන් ස්ථානය- නිවස

- මාර්ගයේ දිග- මීටර් 39.75
- මාර්ගයේ පළල- මීටර් 3
- ග්‍රාම සේවා වසම **-වෙල්ලමංකරය**

තීරණ අංක 20

ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා **විසින් ඉදිරිපත් කර ඇති** වෙල්ලමංකරය **මහතුන් මහතාගේ නිවස අසල මාර්ගය පවරා ගැනීමට අදාල යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්. එම්. කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහ සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

- මාර්ගයේ නම **-මහතුන් මහතාගේ නිවස අසල මාර්ගය**
- ආරම්භක ස්ථානය- මුට්ටුව වේලන්කන්නි පල්ලිය අසල
- අවසන් ස්ථානය- නිවස
- මාර්ගයේ දිග- මීටර් 39.75
- මාර්ගයේ පළල- මීටර් 3
- ග්‍රාම සේවා වසම **-වෙල්ලමංකරය**

xiv. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා **විසින් ඉදිරිපත් කර ඇති බ/නයිනමඩම රුබිස් මහතාගේ නිවස අසල මාර්ගය පවරා ගැනීමට අදාල යෝජනාව** සහා අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාවට යෝජනා කරන ලදී.

- මාර්ගයේ නම **-රුබිස් මහතාගේ නිවස අසල මාර්ගය**
- ආරම්භක ස්ථානය- හලාවත කොළඹ ප්‍රධාන මාර්ගය
- අවසන් ස්ථානය- නිවස
- මාර්ගයේ දිග- මීටර් 197
- මාර්ගයේ පළල- මීටර් 2.70
- ග්‍රාම සේවා වසම **-බ/නයිනමඩම**

තීරණ අංක 21

ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා **විසින් ඉදිරිපත් කර ඇති බ/නයිනමඩම රුබිස් මහතාගේ නිවස අසල මාර්ගය පවරා ගැනීමට අදාල යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්. එම්. කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහ සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

- මාර්ගයේ නම **-රුබිස් මහතාගේ නිවස අසල මාර්ගය**
- ආරම්භක ස්ථානය- හලාවත කොළඹ ප්‍රධාන මාර්ගය
- අවසන් ස්ථානය- නිවස
- මාර්ගයේ දිග- මීටර් 197
- මාර්ගයේ පළල- මීටර් 2.70
- ග්‍රාම සේවා වසම **-බ/නයිනමඩම**

xv. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා **විසින් ඉදිරිපත් කර ඇති වෙල්ලමංකරය ප්‍රදීප් මහතාගේ නිවස අසල මාර්ගය පවරා ගැනීමට අදාල යෝජනාව** සහා අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාවට යෝජනා කරන ලදී.

- මාර්ගයේ නම **-ප්‍රදීප් මහතාගේ නිවස අසල මාර්ගය**
- ආරම්භක ස්ථානය- මුට්ටුව පාර
- අවසන් ස්ථානය- නිවස
- මාර්ගයේ දිග- මීටර් 39.75

- මාර්ගයේ පළල- මීටර් 3
- ග්‍රාම සේවා වසම -වෙල්ලමංකරය

තීරණ අංක 22

ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා **විසින් ඉදිරිපත් කර ඇති වෙල්ලමංකරය ප්‍රදීප් මහතාගේ නිවස අසල මාර්ගය පවරා ගැනීමට අදාල යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්. එම්. කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහ සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

- මාර්ගයේ නම **-ප්‍රදීප් මහතාගේ නිවස අසල මාර්ගය**
- ආරම්භක ස්ථානය- මුට්ටුව පාර
- අවසන් ස්ථානය- නිවස
- මාර්ගයේ දිග- මීටර් 39.75
- මාර්ගයේ පළල- මීටර් 3
- ග්‍රාම සේවා වසම -වෙල්ලමංකරය

xvi. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා **විසින් ඉදිරිපත් කර ඇති මැ/නයිනමඩම පෙරේරා පටුමඟ පවරා ගැනීමට අදාල යෝජනාව** සහා අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාවට යෝජනා කරන ලදී.

- මාර්ගයේ නම **-පෙරේරා පටුමඟ**
- ආරම්භක ස්ථානය- මනුර-නිව්ටන් මාවත
- අවසන් ස්ථානය- පෞද්ගලික ඉඩම
- මාර්ගයේ දිග- මීටර් 86
- මාර්ගයේ පළල- මීටර් 3
- ග්‍රාම සේවා වසම -මැ/නයිනමඩම

තීරණ අංක 23

ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා **විසින් ඉදිරිපත් කර ඇති මැ/නයිනමඩම පෙරේරා පටුමඟ පවරා ගැනීමට අදාල යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්. එම්. කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහ සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

- මාර්ගයේ නම **-පෙරේරා පටුමඟ**
- ආරම්භක ස්ථානය- මනුර-නිව්ටන් මාවත
- අවසන් ස්ථානය- පෞද්ගලික ඉඩම
- මාර්ගයේ දිග- මීටර් 86
- මාර්ගයේ පළල- මීටර් 3
- ග්‍රාම සේවා වසම -මැ/නයිනමඩම

## **04. කාරක සභා වාර්තා සලකා බැලීම.**

i. 2021-06-29 සහ 2021-07-27 වන දින වල පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා සලකා බැලීම.

තීරණ අංක 24

2021-06-29 සහ 2021-07-27 වන දින වල පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සහා සම්මත විය. ඒ අනුව එම වාර්තාවල සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

ii. 2021-07-02 සහ 2021-07-16 වන දින වල පැවති මාර්ග, ඉඩම්, ගොඩනැගිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තා සලකා බැලීම.

තීරණ අංක 25

2021-06-29 සහ 2021-07-27 වන දින වල පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සහා සම්මත විය. ඒ අනුව එම වාර්තාවල සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

iii. 2021-07-28 වන දින පැවති **ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව** සලකා බැලීම.

තීරණ අංක 26

2021-07-28 වන දින පැවති **ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව** සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඩබ්. ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතාගේ හා ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සහා සම්මත විය. ඒ අනුව එම වාර්තාවල සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

iv. 2021-07-12 සහ 2021-07-29 වන දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තා සලකා බැලීම.

තීරණ අංක 27

2021-07-12 සහ 2021-07-29 වන දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සහා සම්මත විය. ඒ අනුව එම වාර්තාවල සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

v. 2021-06-30 සහ 2021-07-20 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභා වාර්තා සලකා බැලීම.

තීරණ අංක 28

2021-06-30 සහ 2021-07-20 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභා වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවල සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

## 05. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සළකා බැලීම.

i. මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය -2021 ජුනි
ii. මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය 2021 - ජුනි

**තීරණ අංක 29**

2021 ජුනි මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය හා 2021 ජුනි මස මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය පිළිබඳ වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

iii. 2021 ජුලි මස ඉන්ධන හා අලුත්වැඩියා වෙනුවෙන් වියදම් වූ වාර්තාව **මහා සභාව විසින් සලකා බලන ලදී.**

iv. 2021ජුලි මස වීථි පහන් නඩත්තු කිරීම පිළිබඳ ප්‍රගති වාර්තාව **මහා සභාව විසින් සලකා බලන ලදී.**

බීගන් බල්බ පැමිණ තිබේදැයි ද ගරු මන්ත්‍රී ඩබ්. ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

සෑම වීථි පහනක්ම නඩත්තු වී ඇති බවත්, බල්බ ඉල්ලා ඇති බවත් ලඟදීම ඒවා ලබා ගත හැකි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ලුණුවිල පාලම් දෙක මැදින් ඇති බල්බ අක්‍රීය වී මාස තුනක් පමණ වන බවත්, මෙවරද වාහනයෙන් අදාල බල්බ නොමැති බව පැවසූ බවත් ඒ සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරන ලෙසද ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මහහැරි ගිය ස්ථාන සඳහා බල්බ 25 ඉල්ලා ඇති බවත් ඒවා ලැබුණු විගස අදාල කටයුතු සිදු කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සභාවෙන් ලයිට් වාහනය පැමිණීමේදී අපහසුතාවයට පත් වන බවත්,ගරු සභාපතිතුමාට හෝ ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාට කතා කල යුතු බවත්, විදුලි අංශයේ සේවය කරන සුදම් පසිඳු මහතාට කතා කල විට විවිධ පිළිතුරු ලබාදෙන බවත්, දුරකථන ඇමතුමක් ගත් විට දුරකථනය ක්‍රියා විරහිත කරන බවත් ගරු මන්ත්‍රී ඩී.එල්. අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී. නිලධාරියෙකු සිටියදී වගකීමක් තිබෙන බවත්, ඔහුව එම වැඩ කටයුතු වලින් ඉවත් කර වෙනත් අයෙකු ඒ සඳහා යොදවන ලෙසද ඉල්ලා සිටින ලදී. අවශ්‍ය බඩු එවීමේදී අඩුවෙන් එවන බවත්, බල්බද අඩුවෙන් එවන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

විශාල වසම් කීපය ඇරෙන්න අනෙක් වසම් වල බල්බ ඉතාමත් අඩු ප්‍රමාණයක් පමණක් වැය බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තම ප්‍රදේශයේ ජනපද තිබෙන බැවින් බල්බ විශාල ප්‍රමාණයක් වැය වන බව ගරු මන්ත්‍රී ඩී.එල්. අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

යම් පුද්ගලයින්ගේ අඩුපාඩු තිබුණද සමස්ථ වීථි පහන් නඩත්තුවේදී බල ප්‍රදේශයට විශාල වැඩ කොටසක් සිදු වන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

විදුලි අංශයට වගකිවයුතු නිලධාරියෙකු පත් කරන ලෙසට ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ඉල්ලා සිටින ලදී. සෑම දේටම ගරු සභාපතිතුමාට කතා කිරීමට නොහැකි බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

මෙය අධීක්ෂණය කර තොරතුරු ඉදිරිපත් කරන ලෙසට ගරු මන්ත්‍රී ඒ.ජ්ස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

## 06. <u>වෙනත් කරුණු ඉදිරිපත් කිරීම</u> .

- වෙළඳ ව්‍යාපාර වෙනුවෙන් ඉදි කිරීම් කරන බවත් , සභාවෙන් නොගන්නා බවත්ඒවාට බල පත්‍ර , හැකිනම් විදුලි බල මණ්ඩලයට විදුලි සැපයුම ලබා දීමේදී අප සභාවේ ආකෘතියකට නිර්දේශයක් ලබා දෙමුයැයිගරු මන්ත්‍රී ඩබ්. ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

  එසේ සිදු කල නොහැකි බවත්, ඒ සඳහා ආදායම් පරීක්ෂකවරුන් යොදවා ඇති බවත් ඔවුන්ගේ රාජකාරිය ඒවා සොයා බලා කටයුතු කිරීම බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

  එම දෙපාර්තමේන්තුව වෙනත් බව ගරු මන්ත්‍රී ඒ.ජ්ස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

  විදුලිය ලබා දීමේදී සභාවෙන් අනුමැතිය ගෙන තිබේදැයි බලා ඒ අනුව විදුලිය ලබා දීමට විදුලි බල මණ්ඩලයට දැනුවත් වීමක් සිදු කල හැකි බව ගරු මන්ත්‍රී ඩබ්. ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

  එම වෙළඳ ව්‍යාපාරයට දැන්වීමක් යවා නඩු දැමීමට හැකි බව ගරු මන්ත්‍රී කේ. නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

  සභාවට ආදායම් නොමැති බව ගරු මන්ත්‍රී ඩබ්. ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

  මෙම කාලයේදී ගැටළු මතු වන බවත් ,නැතිනම් ආදායම් පරීක්ෂක වරුන්ගේ රාජකාරිය එය බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

- තණකොළ කපන යන්ත්‍රය මිලදී ගත් බවත්ඒ , වී ඇති බවත්යක් අවශ්‍යාක්ටර් යන්ත්‍රඑයට වෙනම ට්‍රැ , ක්ටර් කීපයක් ලබා ගැනීමට හැකියාව තිබෙන සම්බන්ධයෙන් සොයා බැලීමේදී දිසාපතිගෙන් ට්‍රැ කටයුතු සිදු කරන ලෙසදඑ සම්බන්ධයෙන් ලිඛිතව ඉල්ලීමක් කර ඒවා ලබා ගැනීමට අවශ්‍ය,බවත්ගරු සභාපතිතුමාගෙන් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ඉල්ලා සිටින ලදී.

  ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල තිබූ ට්‍රැක්ටර් දෙකක් දැනටත් ගෙන භාවිතා කරන බවත්, තවත් ට්‍රැක්ටරයක් ඉල්ලා පුත්තලම දිසාපති කාර්යාලයට ලිපි යවා ඇති බවත්, එහි අදාල ලිපිය පැමිණියද එය ලබා දීමට ප්‍රාදේශීය ලේකම්තුමියට ක්‍රමවේදයක් සකසා ගැනීමට නොහැකිව සිටින බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. ලබන සතිය වන විට එය ලබා දෙන ලෙසට තමන් පැවසූ බවත්, එම ට්‍රැක්ටර් රථ ලබාගෙන සභාවේ භාවිතා කිරීමට නොහැකි ට්‍රැක්ටර් රථ දෙක අපහරණයට දැමීමට තමන් උපදෙස් ලබා දුන් බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

  අදාල මන්ත්‍රීවරුන් ට්‍රැක්ටරය සමඟ පැමිණ අදාල කටයුතු සිදු කරන ලෙසත්, පටු මාර්ග වල ට්‍රැක්ටරය සමග තවත් දෙදෙනෙකු එම කටයුතු වලට යෙදවිය යුතු බවත්, බෝලවත්තේද එය අසාර්ථක වූ බවත් ප්‍රකාශ කරන ලදී.

  මෙමඟින් අතින් තණකොළ කපන ආකාරයට කැපීමට බලාපොරොත්තු විය නොහැකි බවත්, නමුත් විශාල කැළෑ ප්‍රදේශ කපා දැමිය හැකි බවත්, නැතිනම් විශාල කැළෑ කැපීමට සේවයින් දිනක්ම ගන්නා

බවත්, සුමටව කැපිය යුතු ස්ථාන වලට අනෙක් යන්ත්‍රය භාවිතා කල හැකි බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මංගල්ලයක්, පෙරහැරක් පැමිණි විට මෙය අනිවාර්යෙන්ම සභාවෙන් සිදු කරන බවත්, නමුත් පළාත් සභා පාරවල් ඉතිරි වී ඇති බවත්, ඒ සඳහා අදාල නිලධාරීන්ට තමන් ලිපියක් යවනා බවත්, ඒ සඳහා යම් මුදලක් වෙන් කර එම මුදල් සභාවට ලබාදෙන ලෙසට එහි සඳහන් කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

- අගෝස්තු මස 17 වන දින සිට 22 වන දින දක්වා කෙන්යාවේ පැවැත්වෙන මළල ක්‍රීඩා තරඟයට අප බල ප්‍රදේශයේ දරුවෙකු සහභාගී වන බවත්, එම දරුවාට ක්‍රීඩා අරමුදලින් යම් සහයෝගයක් ලබා දීම සුදුසු බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

  මෙම දරුවා කුමන පාසලේ අධ්‍යාපනය හදාරන්නේද යන්නත්, අදාල පාසලේ විදුහල්පති නිර්දේශය තිබේදැයිද යන්නත් ගරු මන්ත්‍රී ඒ.ඒස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විමසා සිටින ලදී.

  වැකඩ මහා විද්‍යාලයේ අධ්‍යාපනය හදාරණ බවත් ,සියළුම ලිපි ලේඛණ තිබෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

  මේ සඳහා ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාද එතුමාගේ අරමුදලින් රු.25,000ක් ලබා දුන් බවත්, එම දරුවා සෙනසුරාදා දින වන විට යායුතු බැවින් එය ඉක්මනින් ලබාදෙන ලෙසද ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ඉල්ලා සිටින ලදී.

| |
|---|
| තීරණ අංක 30<br><br>හලා/වෙන්/වැකඩ මහා විද්‍යාලයේ අධ්‍යාපනය හදාරණ , 2021 අගෝස්තු මස 17 වන දින සිට 22 වන දින දක්වා කෙන්යාවේ පැවැත්වෙන මළල ක්‍රීඩා තරඟයට සහභාගී වන යූ.බී.එම්. රවිඳු දිල්ෂාන් බණ්ඩාර නම් ශිෂ්‍යාට රු.15,000ක මුදලක් ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාවට ගරු මන්ත්‍රී ඒ.එස්. එම්. කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහ සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

- තවමත් ක්‍රීඩා භාණ්ඩ භාර නොගත් ගරු මන්ත්‍රීවරුන් සිටින බවත්, ලබන මාසය වන විට ඒවා ලබා ගන්නා ලෙසත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මෙම වසරේදී ක්‍රීඩා භාණ්ඩ ලබානොදෙන බවත්, ක්‍රීඩා අමාත්‍ය ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් ක්‍රීඩා සැණකෙලියක් පැවැත්වීමට සූදානම් කරගෙන යන බවත් ප්‍රකාශ කරන ලදී. සැප්තැම්බර්, ඔක්තෝම්බර් මස වන විට එය සූදානම් කරන ලෙසද **ක්‍රීඩා සංවර්ධන හා ප්‍රජා සංවිධාන ශක්තිමත් කිරිමේ කාරක සභාවේ ගරු සභාපතිතුමා වන ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතාට ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.**

- ගරු මන්ත්‍රී ඩී.එල්. අමල් සුරංග මහතාගේ 2021 වර්ෂයේ සංවර්ධන යෝජනා සඳහා වෙන් කර ඇති මුදලින් නව ප්‍රජා ශාලාවක් ඉදි කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

  මෙම වසරේ වෙන් කර ඇති මුදලින් එම ප්‍රජා ශාලාව ඉදි කිරීමට සූදානම් බවත්, ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙසද ගරු මන්ත්‍රී ඩී.එල්. අමල් සුරංග මහතා ඉල්ලා සිටින ලදී.

| |
|---|
| තීරණ අංක 31<br><br>2021 වර්ෂයේ සංවර්ධන යෝජනා යටතේ සිංගක්කුලිය කොට්ඨාසයට වෙන් කර ඇති මුදලින් දැනට ඉතිරිව ඇති රු.650,000.00 කට ආසන්න මුදල සිංගක්කුලිය කොට්ඨාසයේ, සෙන්දිරියාමුල්ල ග්‍රාමයේ ,ඇටඹගහවත්ත ජනපදයේ , ප්‍රාදේශීය සභා පෙර පාසල පිහිටි භූමියේ නව ප්‍රජා ශාලාවක් ඉදි කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම පිණිස ගරු මන්ත්‍රී ඩී.එල්. අමල් සුරංග මහතා |

| |
|---|
| විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්. එම්. කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහ සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

- **ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව, සභාවට අයත් මෝටර් ග්‍රේඩරය විශාල සම්පතක් බවත්, එමඟින් වසර 11 පමණ සිට වැඩ කටයුතු සිදු කර ගන්නා බවත් , පසුගිය දිනක තම කොට්ඨාසයේ වැඩ කටයුතු කිරීමේදී එහි තලය සවිකරන කොටසේ යම් කොටසක් කැඩී ගිය බවත් ප්‍රකාශ කරන ලදී. එය නැවතත් යථා තත්ත්වයට පත් කර මේ වන විට වැඩ කටයුතු සිදු කරගෙන යන බවත් ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධයෙන් විමසීමේදී එමඟින් වසර ගණනාවක සිට වැඩ ගත් බැවින් කොටස් ගණනාවක් ගෙවී ගොස් ඇති බවත්, මෝටර් ග්‍රේඩරයේ ප්‍රධාන පොම්පයේ ඔයිල් ලීක් එකක් තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. මේ සඳහා වැඩි අවධානයක් යොමු කර අවශ්‍ය කටයුතු කරන ලෙසද, මෙමඟින් සිදු කරන වැඩ කටයුුතු ඉතාමත් වටිනා බවත් , මෙහි ඇති අළුත්වැඩියාවන් ඉක්මනින් සිදු කරන ලෙසද ඉල්ලා සිටින ලදී.**

- අද දින සෞභාග්‍යයේ මංපෙත් වැඩසටහන සඳහා දින ලබා දෙන ලෙසත්, වැඩ කටයුතු ආරම්භ කල පාරවල් සඳහා උනන්දු වී වැඩ කටයුතු සිදු කරගෙන යන ලෙසත් ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී. සැප්තැම්බර් මස වන විට එන්නත්කරණය ද සිදු කර අවසන් කරන බවත්, දංකොටුව රෝහලේද අළුතින් ඉදි කල කොටස මෙම මස අවසන් වීමට පෙර ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාගේ සහ ගරු රාජ්‍ය අමාත්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මැතිණියගේත් ප්‍රදානත්වයෙන් විවෘත කරන බවත් ප්‍රකාශ කරන ලදී. ලුණුවිල රෝහලද අද වන විට ක්‍රියාත්මක බවත් ප්‍රකාශ කරන ලදී.

- ගරු මන්ත්‍රී ඩබ්.ජොන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව, යොවුන් සේනාංකය දැනට ක්‍රියාත්මක නොවේනම් ,නිරෝදායන මධ්‍යස්ථානයක් ලෙස ගත හැකි බව ප්‍රකාශ කරන ලදී.

එය දැනට හමුදාවෙන් පාලනය වන බවත්, යම් කණ්ඩායමක් එහි දැනට සිටින බවත් එය සොයා බලා යොදා ගත හැකි බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

එය දැනට බහු කාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුව පුහුණු කිරීම් සඳහා යොදා ගන්නා බව ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී. මෙම දිනවල වැඩ කටයුතු නොවන බවත් ප්‍රකාශ කරන ලදී.

එම ගොඩනැඟිලි වලින් ගොඩනැඟිලි කීපයක් හෝ ලබා ගත හැකි බව ගරු මන්ත්‍රී ඩබ්.ජොන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ඊයේ දිනයේදී නව වාට්ටු ඉදි කිරීම සඳහා ස්ථානයක් සෙවීමේදී වීවින් ආයතනය සහ මැල්ලව රෝහල අසල ඇති අක්කර දෙකක පමණ භූමිය යෝජනා කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. අද වන විට වෙන්නප්පුවේ රෝගීන් 200 පමණ ද දංකොටුවේ රෝගීන් 230ක පමණ ප්‍රමාණයක්ද සිටින බවත් සියළුම දෙනාව රෝහල් ගත කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.ඊයේ රාත්‍රියේ 11.30ට පමණ ඔක්සිජන් සිලින්ඩර් අවසන් වී ඇති බව වෛද්‍යතුමා පැවසූ විට සභාවේ රියදුරු මහතෙකු ඉදිරිපත් වී මාරවිල සිට එය දංකොටුවට රැගෙන ගිය බවත් අද ලෝකයේ මෙම ව්‍යසනයත් සමඟ ඔක්සිජන් අත්‍යවශ්‍ය වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

ලුණුවිල රෝහලේ මූලික පහසුකම් සකස් කර ඇති බවත් , රෝහල අසල වාට්ටු සකස් කල හැකි තවත් විශාල ඉඩ කෙටසක් තිබෙන බවත් ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

ඊයේ දිනයේදී ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාගේ නායකත්වයෙන් සූම් තාක්ෂණය ඔස්සේ රැස්වීමක් පැවැත් වූ බවත්, එතුමා එහිදී වෛද්‍යවරුන්ට අවශ්‍ය උපදෙස් ලබා දුන් බවත් ,ගෑස් සිලින්ඩර් 20ක්ද එතුමා ලබා දුන් බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ලුනුවිල රෝහල ඉදි වූ නිසා තවත් ඇම්බියුලන්ස් එකක් ලැබුනු බවත් මේ වන විට ඇම්බියුලන්ස් දෙකක් තිබෙන බවත්, යටිතල පහසුකම් සියළුම දේද ලුණුවිල තිබෙන බැවින් තවත් ඇඳන් 100 පමණ දැමීමට වාට්ටුවක් එහි ඉදි කල හැකි බවත් ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

නිරෝධායනය වන සියළුම පවුල් වලට අනිවාරයෙන්ම රු.10,000ක බඩු මල්ල ලැබෙන බවත්, අදාල PHI මහතා මාර්ගයෙන් අවශ්‍ය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට තොරතුරු ලබා දිය හැකි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එය නිසි ලෙස ක්‍රියාත්මක නොවන බව ගරු මන්ත්‍රීවරුන් ප්‍රකාශ කරන ලදී.

ගැටළු තිබේ නම් දැනුම් දෙන ලෙස ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. PHI මහතුන් කාර්බහුල වී ඇති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

- අළුතින් ඉදි කරන ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය සඳහා කමිටුවක් පත් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී ඩබ් .කාශ කරන ලදීනාන්දු මහතා ප්‍රඇලෙක්ස් නිශාන්ත ප්‍ර.

  ඒ සඳහා කමිටුවක් පත් කර ඇති බව ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කල අතර ගරු මන්ත්‍රී ඩබ්නාන්දු මහතාඇලෙක්ස් නිශාන්ත ප්‍ර.වද එම කමිටුවට ඇතුළත් කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

  මෙය සභාවට අදායම් ලබා ගත හැකි මාර්ගයක් බවත් ,එය ඉක්මන් කරන ලෙසද ඉල්ලා ගරු මන්ත්‍රී ඩබ්නාන්දු මහතාඇලෙක්ස් නිශාන්ත ප්‍ර. ඉල්ලා සිටින ලදී.

- වයික්කාල water front ඉඩමට වසර පහක් පමණ වන බවත්, තවමත් ජලය ලබා දී නොමැති බවත් , ඒ සඳහා නීති මාර්ගයට යාමට සිදු වන බවත් ගරු මන්ත්‍රී ඩබ්නාන්දු මහතාඇලෙක්ස් නිශාන්ත ප්‍ර. ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා ජල සම්පත් මණ්ඩලයේ කලමනාකරණ නිලධාරියෙකු පැමිණිය බවත්, ඇවිත් තමන්ගෙන් තොරතුරු ඉල්ලා ගත් බවත් ,එය ලබන සතිය වන විට ක්‍රියාත්මක වන බවත්, එමෙන්ම හාල්දඬුවන දංවල මාර්ගය වැනි යෝජනා කීපයක් ක්‍රියාත්මක වන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙය ඉඩම් කට්ටි කල ආයතනය විසින් සිදු කල යුතු බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

එම පුද්ගලයාව ජල සම්පත් මණ්ඩලය විසින් අපහසුතාවයට පත් කල බවත්, ඊළඟ මාසය වන විට ජලය ලබා නොදුන හොත් නීති මාර්ගයට යමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.
මෙය එම යෝජනා ගොඩට නොදමන ලෙස ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

දුම්මලදෙණිය කොට්ඨාසයේ ජල සම්පාදන මණ්ඩලය පිහිටි වසම් දෙකක් තිබෙන බවත්, එම වසම් දෙකටම පානීය ජලය නොමැති බව ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

එම වැඩ කටයුතු ඉදිරියේදී සූදානම් කර ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

- පෙප්සි මෝලට විරුද්ධව නඩුවක් දැමීමට සාකච්ඡා කල බවත් එය තවමත් සිදු වී නොමැති බවත්, ගරු මන්ත්‍රී ඩබ්.ඒ. ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.

  පෙප්සි මෝල අනවසර ඉදි කිරීම සම්බන්ධයෙන් ඉතාමත් ඉක්මනින් නඩුවක් දැමීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

න්‍යාය පත්‍රය අනුව සියළු වැඩ කටයුතු අවසන් වූ හෙයින් සියලු දෙනාටම ස්තූතිය පළ කරමින් ගරු සභාපතිතුමා විසින් ප.ව 01.00 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

**තීරණ අංක 01 /2021-09-09**

2021.08.12 **වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය**

**කේ.වී.සුසන්ත පෙරේරා,**
**සභාපති,**
**ප්‍රාදේශීය සභාව වෙන්නප්පුව.**